www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දරුණු ත්‍රස්ත-විරෝධී නීති යටතේ කැනඩාව එල්ටීටීඊය තහනම් කරයි

## Canada bans LTTE under draconian anti-terrorist legislation

**කීත් ජෝන්ස් විසිනි**
**2006 අප්‍රේල් 14**

කැනඩාවේ, කොන්සර්වේටිව් ආන්ඩුව එරට පවත්නා දරුනු ත්‍රස්ත-විරෝධී නීති යටතේ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) තහනම් කල බව ප්‍රකාශයට පත් කර තිබේ.

මින් ඉදිරියට එල්ටීටීඊ සංවිධානයට දැන දූනම මූල්‍ය ආධාර සම්පාදනය කවුරුන් හෝ අවුරුදු 10කට සිරගත කල හැකි ය; මුදල් ආධාර එකතු කරමින් හෝ වෙනත් ආකාරයකින් එල්ටීටීඊයේ වැඩ කටයුතු "පහසු කිරීමට" කටයුතු කරන කෙනෙක් අවුරුදු 14ක සිරදඬුවමකට මුහුන පානු ඇත.

එල්ටීටීඊ විරෝධී "ඔත්තු සේවයක්" කැනේඩියානු ආන්ඩුව විසින් පිහිටුවනු ලැබ ඇතැයි මහජන ආරක්ෂක ඇමති ස්ටොක්වෙල් ඩේ කර ඇති ප්‍රකාශය පෙන්නුම් කරන්නේ එල්ටීටීඊ සහකරුවන් හිරේ දූමීම සහ ඔවුන් රටින් පිටුවහල් කිරීමට මෙම නීති රීති යොදා ගැනීමට ආන්ඩුව කල් බලන බව ය.

මේ සඳහා වෙන ම යොදවනු ලැබ තිබෙන දුරකතන මාර්ගයකින් රාජ්‍ය අධිකාරීන්ට එල්ටීටීඊ ක්‍රියාකාරකයන් පිලිබඳව ඔත්තු දී එලිදරව් කිරීමට ඉදිරිපත් වන ලෙස කැනඩාවේ පුලුල් පිටුවහල් ආගාමික දෙමල වැසියන්ට ඩේ තරයේ කියා සිටියේ ය.

ඔහු මෙම තහනම යුක්ති සහගත කිරීම සඳහා හේතුවක් ලෙස ඉදිරිපත් කලේ එල්ටීටීඊ සංවිධානය දෙමල ජනයාගෙන් මුදල් ප්‍රතිපාදන උදුරා ගැනීම සඳහා ප්‍රචන්ඩ බලය යොදවන බවට තර්ජනය කරන්නේ ය යන්නයි. එහෙත් දූනට පවත්නා කැනේඩියානු නීතිය යටතේ වුව එවන් තර්ජන කිරීම් නීති විරෝධී ය.

ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත්වල වැඩි කොටසක් පාලනය කරන එල්ටීටීඊය තහනම් කිරීමට එරෙහිව කම්කරු පන්තිය සහ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට පක්ෂ සියලු දෙනාම ඉදිරිපත් විය යුතු ය.

කැනඩාවේ පවත්නා ත්‍රස්ත-විරෝධී නීති ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා සිවිල් අයිතිවාසිකම් දරුනු හා කැපී පෙනෙන ලෙස උල්ලංඝනය කරයි.

එම නීති මගින් රාජ්‍යය උත්සාහ කරන්නේ එරට පාලක පන්තියේ අවශ්‍යතාවන්ට එරෙහි යයි නිගමනය කරන ලද්දා වූ දේශපාලන ව්‍යාපාර අපරාධකාරීන් යයි හංවඩු ගැසීමට ය. මෙවන් ව්‍යාපාරවලින් බොහොමයක් ඇත්තවසයෙන් පැන නැංගේ කැනඩාව මිත්‍රකම් පවත්වන්නාවූ විවිධ පාලන තන්ත්‍ර විසින් ගෙන යන ලද රාජ්‍ය ත්‍රස්තයට එරෙහි ප්‍රතිචාර ලෙස ය.

මෙම නීති සිවිල් වැසියන්ට එරෙහිව එල්ල කෙරුනු ප්‍රහාරයන් සහ මර්දනකාරී පාලන තන්ත්‍රයන්හි ආරක්ෂක භටකායන්ට එරෙහිව එල්ල කරන ලද ප්‍රහාරයන් ද යන දෙක අතර වෙනස දූකීමට අසමත් ය; එපමනක් නොව මේවාට අනුව කවර කලෙක හෝ කිසිදු ප්‍රචන්ඩ ක්‍රියාවක් සංවිධානය නොකලා වූ ද එවැන්නකට සම්බන්ධ නුවූ ද කෙනෙකු ත්‍රස්තවාදී යයි තීන්දු කල හැකි වේ. ත්‍රස්තවාදී යැ යි ලේබල් අලවනු ලැබූ සංවිධානයක වැඩ කටයුතුවල කුමන අංශයකට හෝ ආධාර කිරීම අරමුදල් එකතු කිරීම, දේශපාලන ප්‍රචාරය පතුරුවා හැරීම, හෝ සහන සම්පාදක කටයුතුවල නිරත වීම යන මේ කුමක හෝ නිරත වන්නෙකු අවුරුදු 10කට හෝ ඊට අධික කාලයක සිර දඬුවම්වලට ලක් කරනු ලබයි. එපමනක් නොව, මෙම නීති ක්‍රියාත්මක කිරීම, කැනඩාවේ සන්නද්ධ හමුදාවන් ප්‍රසාරනය කිරීම ද ප්‍රතිසන්නද්ධ කිරීම ද යුක්ති සහගත කිරීමට උදව් කාරක වෙයි; ලෝකය පුරා ගෙනයනු ලබමින් පවත්නේ යයි කියන ඊනියා 'ත්‍රස්ත විරෝධී යුද්ධයට' කැනඩාවේ සහාය හා සහභාගිත්වය සැපයීම සමග මෙය අත්වැල් බැඳ ගෙන තිබෙන අතර, මේවා යොදාගන්නේ උතුරු ඇමරිකානු හා ජාත්‍යන්තර ධනේශ්වර පන්තියේ අවශ්‍යතාවන්ට වඩාත් ගැලපෙන පාලන තන්ත්‍රයන් ඒ ඒ රටවල් තුල පිහිටුවීම හෝ ඒවාට මුක්කු ගැසීම ය.

ත්‍රස්තවාදය කෙරේ 'මෘදු' ආකල්පයක් දක්වන්නේ යයි ද බුෂ් පාලනාධිකාරය කෙරේ ඇති තරම් පක්ෂපාතිත්වයක් දක්වන්නේ නැතැයි ද දීර්ඝ කාලයක් තිස්සේ කොන්සර්වටිව් පක්ෂය විසින් හෙලා දකිනු ලැබූ කලින් රට පාලනය කල ලිබරල් ආන්ඩුවට පහරක් එල්ල කරමින් ඩේ මෙසේ කීය. "එල්ටීටීඊය (ත්‍රස්තවාදී සංවිධානයක් යයි) නම් කිරීම කල යුතුව තිබුනේ මීට බොහෝ කලකට පෙර ය. ඒ වනාහි කලින් පැවති ආන්ඩුව විසින් බරපතලව සලකා ක්‍රියාත්මක කරනු නොලැබූ පියවරකි." ඩේ මෙසේ ද කීය: "අපේ ආන්ඩුව පැහැදිලිව තීන්දු කොට තිබෙන්නේ ත්‍රස්තවාදයට එරෙහි කැනඩා පුරවැසියන් සියල්ලගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගැනීමට ය."

ජනවාර්ගික පිලිවෙතක් උඩ තවත් ධනේශ්වර ජාතික-රාජ්‍යයක් පිහිටුවා ගැනීමට වෙරදරන එල්ටීටීඊයේ ඉදිරි දර්ශනයට ද සිංහල කම්කරුවන් හා ගොවීන්ට එරෙහිව

එම සංවිධානය විසින් එල්ල කරනු ලබන ඉව බව නැති ප්‍රචණ්ඩත්වයට ද ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගනන් නැති අවස්ථාවල තම විරුද්ධත්වය පැහැදිලි කර තිබේ.

එසේ වන අතර ම, පසු ගිය වර්ෂ 23ක් තිස්සේ ශ්‍රී ලංකාව සොලවා දමා තිබෙන සිවිල් යුද්ධයට වගකීම ඇත්තේ ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තියට හා එහි අධිරාජ්‍යවාදී ආධාරකරුවන්ට වන බව ද අපි නොවලහා ප්‍රකාශ කර ඇත්තෙමු.

1948 ස්වාධීන ශ්‍රී ලංකාවක් බිහි වූ අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තිය දෙමල වතු කම්කරුවන් (ඊනියා ඉන්දියානු ද්‍රවිඩයන්) ගේ පුරවැසි අයිතිය අහෝසි කලේ ය. 1950 ගනන්වල දී සිංහලය රටේ තනි රාජ්‍ය භාෂාව බවට පත් කරන ලදී. අවුරුදු 15කට පසුව බහුතර සිංහලයන් අදහන්නා වූ ආගම වන බුද්ධාගම රාජ්‍ය ආගම යයි ප්‍රකාශ කරන ව්‍යවස්ථාවක් සම්මත කිරීම ද දෙමල ජනයාට ඉහල අධ්‍යාපනයට සීමා පනවමින් පංගු-පේරු නීති ක්‍රියාත්මක කිරීම ද සිදු කරන ලදී. අන්තිමේදී 1983 දී රාජ්‍යය විසින් සකසා ක්‍රියාත්මක කෙරුනු දෙමල විරෝධී සංහාරයට ටික කලකට පසුව සිවිල් යුද්ධය පුපුරා ගියේ ය.

සඳුදා පුවත්පත් සාකච්ඡාවෙන් ඉක්බිති ඕ ද විදේශ කටයුතු භාර ඇමති පීටර් මැකේ ද, ඔවුන් විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීම එල්ටීටීඊය ද ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය ද අතර ස්ථිර හවුලක් ඇති කිරීමට දරෙන ප්‍රයත්නයට බාධාවක් වනු ඇතැයි කැනේඩියානු දෙමල ජනයා විසින් එල්ල කරන ලද විවේචන ප්‍රතික්ෂේප කලහ.

එහෙත් ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව ද සිංහල ජාතෝන්‍යාත්තමවාදීන් ද කැනේඩියානු ආන්ඩුවේ තීන්දුව උනන්දුවෙන් හා සාදරයෙන් පිලිගෙන ඇත; එම තීන්දුව -- එල්ටීටීඊය තමන්ට ගැලපෙන සාම සහකරුවෙකු නොවේ යයි ඔවුන් විසින් කරන කියා පෑම්වලට විශ්වසනීයත්වයක් ලබා දෙන්නේ යයි ද, එය දකුනු ආසියාවෙන් පිටත ශ්‍රී ලාංකික දෙමල ජනගහනය වැඩියෙන් ම සිටින රට වන කැනඩාවෙන් මුදල් එකතු කිරීමට එල්ටීටීඊයට පවත්නා හැකියාවට තර්ජනයක් වන්නේ යයි ද එමගින් එල්ටීටීඊයට එරෙහිව තමන්ගේ අත ශක්තිමත් කරන්නේ යයි ද සිංහල ජාතෝන්‍යාත්තමවාදීන් උදම් වන බව නිසැක ය.

කැනඩාවේ ආන්ඩුව විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීම ලඟ දී පැවැත්වීමට නියමිත සාම සාකච්ඡාවල දී "මුලු ලෝක ප්‍රජාව ම ටිකෙන් ටික එල්ටීටීඊයට එරෙහිව තමන්ගේ ආධාරයට එමින් සිටින බව" දැනගැනීම නිසා "ආන්ඩුවේ නියෝජිත කන්ඩායම" වඩා ශක්තිමත් පදනමක තැබෙනු ඇතැයි ආන්ඩුව විසින් දුවවනු ලබන ඩේලි නිව්ස් පුවත්පත කෙකර ගෑවේ ය.

ආක්‍රමනශීලී ජාතෝන්‍යාත්තමවාදී දක්ෂිනාංශික පුවත්පතක් වන ද අයිලන්ඩ් පුවත්පත කොන්සර්වේටිව් කැනේඩියානු ආන්ඩුව අනුයන ලෙස යුරෝපීය සංගමයෙන් ද ඉල්ලා සිටියේ මෙසේ යඃ "ත්‍රස්තවාදී කන්ඩායමකට නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩ ලබා දීමේ අන්තරාය ය වටහා ගත් කැනඩාව අන්තිමේ දී එම සංවිධානයට ඉවත් වන ලෙස අනදී ඇත. යුරෝපා සංගමයට ද තව දුරටත් කල් නොමරා ඒ අනුව යාමට කාලය එලඹ ඇත."

සිංහල ජාතෝන්‍යාත්තමවාදයේ හඬක් වන නපුරුම යුදවාදී බෞද්ධ පූජක-නීත හෙල උරුමය පක්ෂය (ජේඑච්යූ) එල්ටීටීඊය තහනම් කිරීම ගැන කැනේඩියානු ආන්ඩුවට ප්‍රසංශා කරමින් එල්ටීටීඊය කෙරේ වඩාත් ආක්‍රමනශීලී ආකල්පයක් නොගැනීම ගැන ලංකාවේ ආන්ඩුව විවේචනය කරයි.

නෝර්විජියානු නායකත්වයෙන් යුක්ත ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) යලියලිත් අනතුරු හඟවා ඇත්තේ 2002 පෙබරවාරි පටන් ක්‍රියාත්මකව පවත්නා සටන් විරාමය බිඳ වැටීමට ආසන්න බවත්, රට වහා ම පූර්න සිවිල් යුද්ධයට ඇද වැටෙනු ඇති බවත් ය.

එල්ටීටීඊයට පනවා ඇති කැනේඩියානු තහනම එම සංවිධානය මත පීඩනය උග්‍ර කරමින් එමගින් රට සිවිල් යුද්ධයකට යලිත් ඇද දැමීමට කැමතිව සිටින්නා වූ ද එල්ටීටීඊයට සැලකියයුතු බලයක් දෙමින් සන්ධීය හෝ සහසන්ධීය රාජ්‍යයක් නිර්මානය කිරීමට අකැමති වන්නා වූ ද කොටසට ආධාර දෙමින් ශ්‍රී ලංකාවේ ජනයා ප්‍රචණ්ඩත්වයේ ද භීෂනයේ ද නව පාතාලයකට ඇද දැමීමට පක්ෂපාතී අයට ආධාර සපයයි.

කොන්සර්වටිව් ආන්ඩුවේ මෙම තහනම නව ආන්ඩුව කැනඩාවේ විදේශ ප්‍රතිපත්තිය සහ භූ-දේශපාලන ආස්ථානය තියුනු ලෙස දකුනට පන්නවා ඇති බව පෙන්නුම් කරයි. හමාස් සංවිධානය පලස්තීනයේ පාලනය සියතට ගත් කල්හි පලස්තීන අධිකාරයට ආධාර මුදල් සැපයීම නවතා ලන බවට ප්‍රකාශ කල ලෝකයේ රටවල් අතර මුල් ම එකක් වූයේ කැනඩාව ය. පසු ගිය මාසයේ දී කැනේඩියානු අගමැති ස්ටීවන් හාපර් ඇෆ්ඝනිස්ථානයට තුන් දින සංචාරයක යෙදෙමින් ඒ රට වසර තුනක් තිස්සේ ආක්‍රමනය කර සිටින කැනේඩියානු සන්නද්ධ හමුදාවන්ට තම ආන්ඩුවේ ආධාරය තහවුරු කර සිටියේ ය; වඩාත් "ක්‍රියාශීලී" විදේශ සහ යුද්ධමය පිලිවෙතක් ගෙන යාමට කැප වීම පෙන්නුම් කරමින් "ලෝකයේ මහ බලවතුන්ට" කැනඩාවත් ඉන්නා බව ඇඟවීම තම අදහස බව ප්‍රකාශ කලේ ය.

© www.wsws.org